DOI: https://doi.org/10.4038/jdrra.v2i1.37

*The Journal of Desk Research Review and Analysis, Vol. 2, Issue 1, 2024, 1-11.*

# STUDY ON ROYALS FUNERAL RITUALS IN KANDYAN KINGDOM

HC Gunasinghe[1]

## Abstract

In the ancient period, special funeral rituals were followed after the death of elites. Also, many special funeral rituals were followed at royal funerals. Detailed information about the royal funerals of Sri Lanka is found in the Kandy era. This research aims to find out the royal funeral rituals of the Kandy era. The problem of this research is identifying the order of royal funeral rituals in the Kandy era. The research method is studying literary sources. There is a detailed account of the royal funeral of Prince Maha Astana, the eldest son of King Wimaladharmasuriya I (1590-1604); apart from that, some information about the funerals of Wimaladharmasuriya I, Rajasinghe II (1635-1687) and Sri Vijaya Rajasingha (1739-1747) can be found. According to the sources, there are several royal funeral rituals. It has received Buddhist background as well as Hindu and Western inspiration. In the beginning, the royal funerals of the Kandy era were solemn and elaborate, but later it became simple. The political instability in the kingdom may have caused it.

***Keywords***: Kingdom of Kandy, Funeral Rituals, Royal Burials

---

[1]Lecturer, Department of History, University of Kelaniya, Sri Lanka

Email: hasithac@kln.ac.lk https://orcid.org/0009-0005-6838-6696

The Journal of Desk Research Review and Analysis © 2024 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 02.07.2024
Accepted date: 22.10.2024

# මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනයක්

එච්.සී. ගුණසිංහ

**සාරසංක්ෂේපය**

සමාජයේ ප්‍රභූත්වයක් ඉසිලූ පුද්ගලයන්ගේ මරණය අරබයා සුවිශේෂී අවමංගල්‍ය චාරිත්‍ර විධි සිදු කළ බව ලොව පුරා ශිෂ්ටාචාරවලින් සාධක හමු වේ. එහිදී රාජකීයයන්ගේ මරණය සමග බැඳී පවතින සුවිශේෂී චාරිත්‍ර විධි රැසකි. සූර්යයාගෙන් පැවත ඒම, දේව වරමක් හිමිවීම, බෝධිසත්වයකු වීම සහ නරදේවයකු වීම වැනි සංකල්ප ඒ සඳහා බලපාන්නට ඇත. ලංකාවේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් හමුවන්නේ මහනුවර යුගයට අදාළව ය. ඒ අනුව මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ සොයා බැලීම අරමුණු කරගත් මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත්වූයේ එකී රාජකීය අවමංගල්‍ය චාරිත්‍රවල අනුපිළිවෙල කෙබඳුවී ද යන්න හඳුනාගැනීමයි. එහිදී පර්යේෂණ ක්‍රමවේදය බවට පත්වූයේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය උත්සව අතරින් සවිස්තරාත්මක වාර්තාවක් හමුවන්නේ පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ (1590-1604) පුත් මහා අස්තාන කුමරුගේ අවමංගල්‍ය උත්සවය සම්බන්ධයෙන් පමණි. ඊට අමතරව පළමුවන විමලධර්මසූරිය, දෙවන රාජසිංහ (1635-1687) සහ ශ්‍රී විජය රාජසිංහ (1739-1747) යන රජවරුන්ගේ අවමංගල්‍ය උත්සව පිළිබඳ දේශීය සහ විදේශීය මූලාශ්‍රයවල යම් පමණකට තොරතුරු අන්තර්ගත වේ. මෙකී අවමංගල්‍ය චාරිත්‍ර සඳහා බෞද්ධාගමික පසුබිම මෙන්ම හින්දු සහ බටහිර ආභාසය ලැබී තිබෙන බව පැහැදිලිව හඳුනාගත හැකිය. මහනුවර යුගය ආරම්භයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලද රාජකීය අවමංගල්‍ය කල්යත්ම සරල වී ඇති බව පෙනේ. රාජධානියේ පැවති දේශපාලන අස්ථාවරත්වය ඊට හේතු වූ බව පිළිගත හැකිය.

***ප්‍රමුඛ පද*** : මහනුවර රාජධානිය, අවමංගල්‍ය චාරිත්‍ර, රාජකීය සුසාන

## හැඳින්වීම

පුද්ගලයකු මරණයට පත් වූ විට ඔහු සමාජයේ ඉසිලූ තත්ත්වය, ඔහුගෙන් සමාජයට සිදු වූ සේවය යනාදිය සැලකිල්ලට ගෙන ඔහුට දක්වන ගෞරවයක් වශයෙන් සිදු කරන අවමංගල්‍ය චාරිත්‍ර විධි රැසකි. එකී චාරිත්‍ර විධි සඳහා මියගිය පුද්ගලයාගේ ආගමික ලබ්ධිය හා මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාස විශාල බලපෑමක් සිදු කරන බව හඳුනාගත හැකිය. ලොව පුරා ශිෂ්ටාචාරවල ප්‍රභූ පුද්ගලයන්ගේ මරණය අරබයා සුවිශේෂී අවමංගල්‍ය චාරිත්‍ර විධි සිදු කළ බවට සාධක හමු වේ. එහිදී රජවරුන් හා රාජකීය පවුලේ සාමාජිකයන් වෙනුවෙන් සිදු කෙරෙන සුවිශේෂී අවමංගල්‍ය චාරිත්‍ර විධි රැසකි. සූර්යයාගෙන් පැවත ඒම, දේව වරමක් තිබීම හා බෝධිසත්වයකු වීම වැනි සංකල්ප ඒ සඳහා බලපාන්නට ඇත.

## ක්‍රමවේදය

මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනය කෙරෙන මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් යොදාගන්නා ලද්දේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. සමකාලීන දේශීය මෙන්ම විදේශීය ප්‍රාථමික මූලාශ්‍රය හා ඒ ඇසුරෙන් සම්පාදිත ද්විතීයික මූලාශ්‍රය ගණනාවක් තොරතුරු ලබාගැනීම සඳහා උපයෝගී කරගැනිණි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර විධි පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර විධිවල අනුපිළිවෙල කෙබඳුවී ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව බවට පත්විය.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

මහනුවර යුගයේ රජකුගේ අභාවයත් සමග පළමුව අවධානය යොමුව ඇත්තේ රාජකීය ආදාහන උත්සවය පැවැත්වීමට නොව, රජතුමාගේ අනුප්‍රාප්තිකයා සිහසුනට පත්කිරීම පිළිබඳවයි. රජතුමාගේ අභාවයත් සමග ඇතිවන අරාජිකත්වය වහාම නිමාකිරීම එහි අරමුණ වූ බව පෙනේ. අභිනව රජතුමා උපදෙස් පරිදි අභාවයට පත් රජතුමාගේ අවමංගල උත්සවයේ කටයුතු වෙනුවෙන් රදල ප්‍රධානීන් යොමුව තිබේ (Davy, 1821, pp. 158-159).

රාජකීය අවමංගල්‍යයකදී පළමුව සිදුවූයේ මඟුල්මඩුව ඉදිරිපිට පස්ලෝ බඳුනක වී ගොඩ ගසා, ඒ මත නැගී මිනිසකු මළබෙර වාදනය කිරීමයි. එය නිලමේවරුන්ට කාලවර්ණ වස්ත්‍රයෙන් සැරසී කණගාටුව පළ කිරීම සඳහා හඬ නඟා වැලපීමටත්, විලාපදීමටත් අවසර ලබාදීමේ සංඥාව ඉංග්‍රීසි ජාතික වෛද්‍ය ජෝන් ඩේවි සඳහන් කරයි (Davy, 1821, pp. 161). මළබෙර වයන්නාගේ වේතනය වූයේ වී පැල සහ පස්ලෝ බඳුනයි. අගනුවර ආසන්නයේ පදිංචි බෙරවා

කුලයේ සාමාජිකයන්ට මළබෙර වැයීමේ කාර්යය පැවරී තිබිණි. එහිදී ඔවුන්ට කාලවර්ණ වස්ත්‍ර ලබාදිය යුතු විය. එයින් එක් වස්ත්‍රයක් කරෙහිලා, අනෙක සුම්බරයක් මෙන් හිසේ බැඳ උදේ දිවා රාත්‍රී තෙවරක් මළබෙර වැයීමේ කාර්යයේ ඔවුන් නියැලී තිබේ (නිශ්ශංක, 2005, පි. 126).

මේ සමගම අගනුවර පුරා අණබෙර පිටත්කොට, රජතුමාගේ අභාවය පිළිබඳ ජනතාවට සැල කෙරිණි (*මන්දාරම්පුර පුවත*, 2013, 616 කවිය). මෙතැන් සිට රාජධානිය පුරා ශෝක කාලය ආරම්භ වූ හෙයින් සියලු ආකාරයේ ප්‍රීති උත්සව හා විනෝද ක්‍රීඩා නවතා, ශෝකය පළ කරන සලකුණු දැකගත හැකි වූ බව ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් සඳහන් කරයි (Knox, 1681, p. 42).

**මෘතදේහය අවසන් කටයුතු සඳහා සූදානම් කරවීම**

මේ අතරවාරයේ අභාවයට පත් රජතුමාගේ මෘතදේහය මිනීපෙට්ටියක තැන්පත් කිරීම සඳහා කටයුතු සංවිධානය වූ බව ඩේවි දක්වතත් (Davy, 1821, pp. 161), මෘතදේහය හෝ මිනීපෙට්ටිය සැකසූ ආකාරය හෙතෙම සඳහන් කර නැත. රජතුමාගේ මෘතදේහය පෙර සිරිත් පරිදි ගෞරවයෙන් දුහුල්පට වස්ත්‍රයකින් සත්වරක් වෙලීමෙන් අනතුරුව කළු හා නිල් පැහැති රෙදි ඇතිරූ දෙණක තැන්පත් කළ බව *මන්දාරම්පුර පුවතේ* සඳහන් වේ (*මන්දාරම්පුර පුවත*, 2013, 617 කවිය). ඒ නිසා මේ සම්බන්ධයෙන් පුළුල් අදහසක් ලබාගැනීමට රදල ප්‍රධානියකුගේ අභාවයේදී මෘතදේහය සකස් කළ ආකාරය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

රදල ප්‍රධානියකු අභාවයට පත් වූ විට මෘතදේහය සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව ඔහු පැළැඳි සියලුම වස්ත්‍රාභරණ මෘතදේහයට පළඳවනු ලැබේ. ඒ කාර්යය සිදු කරන ලද්දේ රදල ප්‍රධානියාගේ නිලකාරයන් විසිනි. මියගිය රදල ප්‍රධානියා සම්පූර්ණ නිල ඇඳුමෙන් සරසා නොතිබීම ඔහුට කරන අගෞරවයක් වශයෙන් සැලකිණි. රදල ප්‍රධානියාගේ මෘතදේහය ආදාහන බිමට රැගෙන යන තෙක් එහි සිවුකොණ ආරක්ෂාවට නිල ඇඳුමින් සැරසුණු සේවකයන් සිවුදෙනෙකු සිටි බව කියැවේ (නිශ්ශංක, 2005, පි. 125-127). ඉහත තොරතුරුවලට අනුව රජතුමාගේ මෘතදේහය සුවඳ දියරවලින් සෝදා පිරිසිදු කොට, රාජකීය වස්ත්‍රාභරණාදියෙන් සැරසවීමේ කාර්යය දියවඩන නිලමේ, සළුවඩන නිලමේ, සට්ටම්බිරාලවරුන් හා දුක්ගන්නාරාලවරුන් විසින් සිදු කරන්නට ඇතැයි පිළිගත හැකිය.

රාජකීය මෘතදේහය තැන්පත් කරන මිනීපෙට්ටිය සකසා තිබූ ආකාරය පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් මූලාශ්‍රය මගින් හෙළි නොවුණ ද, කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස (1747-1782) අපවත් වූ වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ මෘතදේහය තැන්පත් කළ මිනීපෙට්ටිය සකසා තිබූ ආකාරයෙන් ඒ පිළිබඳ යම් අදහසක් ගොඩනගා ගත හැකිය.

සඟරජ මාහිමියන්ගේ දේහය කොට්ට ඇතිරූ දෙණක (මිනීපෙට්ටියක) තැන්පත් කළ බවත්, දෙණ තැන්පත් කළ කූණම (පල්ලැක්කිය හෙවත් දෝලාව) ඇත්දත් කැටයම්, රිදීබුබුලු සහ විචිත්‍ර සිතුවමින් අලංකාර කර තිබූ බවත් *සංඝරාජ සාධු චරියාවේ* සඳහන් වේ (*සංඝරාජ සාධු චරියාව*, 1997, පි. 53). ඒ අනුව රජතුමාගේ මෘතදේහය තැන්පත් කළ මිනීපෙට්ටිය හා කූණම ද එයාකාරයෙන්ම සැකසෙන්නට ඇතැයි පිළිගත හැකිය. එකල මිනීපෙට්ටිය නොඑසේ නම් දෙණ හඳුන්වා ඇත්තේ 'පේලාව' යනුවෙන් බව *සංඝරාජ සාධු චරියාවෙන්* අනාවරණය වේ (*සංඝරාජ සාධු චරියාව*, 1997, පි. 53). රජතුමාගේ මෘතදේහය තැන්පත් මිනීපෙට්ටියේ සිවුකොණ ආරක්ෂාවට රාජපුරුෂයන් සිටුවා තබන්නට ඇත. එතැන් පටන් මෘතදේහය ආදාහනය කරන අවස්ථාව දක්වා කාලවර්ණ වස්ත්‍රයෙන් සැරසී දිවා රෑ මහ හඬින් විලාප දී හැඬීමේ කාර්යය දුක්ගන්නාරාලවරුන්ට හා ඔවුන්ගේ බිරින්දෑවරුන්ට පැවරුණු කාර්යයක් වී තිබේ (නිශ්ශංක, 2005, පි. 126).

**රාජකීය මෘතදේහ සංරක්ෂණය**

රාජකීය මෘතදේහය ආදාහනය කරන තෙක් සුරක්ෂිතව තබාගැනීම සඳහා කිසියම් සංරක්ෂණ ක්‍රමයක් අනුගමනය කළේ ද යන්න පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. නොක්ස් සඳහන් කරන ආකාරයට මෘතදේහයක් දින කිහිපයක් ආරක්ෂිතව තබාගැනීම සඳහා සිදු කර ඇත්තේ මෘතදේහයේ සියලු අතුණුබහන් ඉවත්කොට, උදර කුහරයට ගම්මිරිස් පුරවා වසා තැබීමයි. රදල ප්‍රධානියකුගේ අභාවයේදී බොහෝ විට අනුගමනය කරන ලද්දේ මෙකී ක්‍රමයයි (Knox, 1681, p. 116).

එහෙත් නරදේවයකු වශයෙන් සැලකූ රජතුමා ජීවත්ව සිටියදී මෙන්ම අභාවයට පත් වූ විට ද ස්පර්ශ කිරීමට පවා සාමාන්‍ය වැසියන් බිය වූ පසුබිමක (*හත්ථවනගල්ල විහාරවංශ*, 2001, පි. 83-95), රාජ නිලධාරීන් රජතුමාගේ මෘතදේහය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් ඉහත ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කළේ ද යන්න සැකසහිත ය.

රාජකීය මෘතදේහ සංරක්ෂණය කළ අන්දම පිළිබඳ කිසියම් තොරතුරක් හඳුනාගත හැක්කේ පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ (1590-1604) වැඩිමහල් පුත් මහාඅස්තාන කුමරුගේ අභාවය පිළිබඳ තොරතුරු දැක්වෙන ලන්දේසි ජාතික වැලන්ටයින්ගේ වාර්තාවේ ය. ඊට අනුව මහාඅස්තාන කුමරුගේ මෘතදේහය තැන්පත් කුණම ආවරණය කොට ඇත්තේ කුළුබඩු හා වූල් ආදියෙනි (Lawrie, 1896, p. 1). මේ අනුව නිගමනය කළ හැක්කේ රජතුමාගේ මෘතදේහය අභ්‍යන්තරයට කුළුබඩු ඇතුළු නොකොට, මෘතදේහය තැන්පත් කුණම පමණක් කුළුබඩුවලින් ආවරණය කර තබන්නට ඇති බවයි.

**රාජකීය ආදාහන භූමිය**

මහනුවර රාජධානිය ආරම්භයේ පටන් රජවරුන්ගේ ආදාහන භූමිය බවට පත්වූයේ 'අස්ගිරි ආදාහන මළුව' නම් ස්ථානයයි. එහි සිදු කළ ප්‍රථම රාජකීය ආදාහන උත්සවය වූයේ ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජතුමාගේ (1357-1374) මෙහෙසිය වූ චන්ද්‍රවතී දේවියගේ ආදාහනයයි. දේවියගේ මෘතදේහය ආදාහනයෙන් පසුව එම ස්ථානයේ බෝධිශාඛාවක් රෝපණය කළ රජතුමා මෙහෙසියගේ භෂ්මාවශේෂ තැන්පත්කොට ගෙඩිගේ විහාරයක් එතැන කරවා තිබේ. පසුව එම බෝධිය හා විහාරය පිළිවෙලින් 'චන්ද්‍රවතී බෝධිය' හා 'අස්ගිරි ගෙඩිගේ විහාරය' නමින් ප්‍රකට වූ බව *අස්ගිරි උපතේ* සඳහන් වේ (සීලක්ඛන්ධ හිමි, 1997, පි. 95).

චන්ද්‍රවතී දේවියගේ ආදාහනයෙන් පසුව උඩරට රාජධානිය ස්ථාපිත කළ පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ ආදාහනය තෙක් වෙනත් රාජකීය ආදාහන උත්සවයක් අස්ගිරි ආදාහන මළුවේ පැවැත් වූ බවට සාධක හමු නොවේ. හඟුරන්කෙතදී අභාවයට පත් දෙවන රාජසිංහ (1635-1687) හා දකුණු ඉන්දියාවේ වෙල්ලෝරයේදී අභාවයට පත් ශ්‍රී වික්‍රම රාජසිංහ (1798-1815) යන රජවරුන්ගේ ආදාහන උත්සව හැරුණු විට මහනුවර සිහසුනට පත් අනෙක් සියලු රජවරුන්ගේ මෘතදේහ ආදාහනය කරන ලද්දේ අස්ගිරි ආදාහන මළුවේදී ය (දිසානායක, 1997, පි. 70; හේමපාල, 1999, පි. 68).

විශේෂ වරප්‍රසාදයක් වශයෙන් රජතුමාගේ මෙහෙසිය හා රජතුමාගේ වැඩිමහල් සොයුරියගේ ආදාහන කටයුතු සඳහා අස්ගිරි ආදාහන මළුව යොදාගත් බව කියැවේ. අවශේෂ රාජකීයයන් සියලුදෙනාගේ ආදාහන කටයුතු සිදු කරන ලද්දේ මහනුවර උඩවත්ත කැලයේ රාමවිහාරය පිටුපස පිහිටි 'බණ්ඩගේතැන්න' නම් ස්ථානයේදී ය. එහෙත් වැලන්ටයින්ගේ වාර්තාවට අනුව පළමුවන විමලධර්මසූරිය හා සෙනරත් (1604-1635) යන රජවරුන්ගේ අගබිසව වූ කුසුමාසන දේවියගේ මෙන්ම මහාඅස්තාන කුමරුගේ මෘතදේහ ආදාහනය කර ඇත්තේ අස්ගිරි ආදාහන මළුවේදී ය (Lawrie, 1896, p. 1-2). කුසුමාසන දේවිය උඩරට රාජධානියේ නීත්‍යානුකූල හිමිකාරිය වීමත්, මහාඅස්තාන කුමරු සිහසුන් උරුමකරුවකු වීමත් හේතුවෙන් එවන් ගෞරවයක් හිමිවන්නට ඇත (*රාජාවලිය*, 1997, පි. 239, 245-246, 249).

**රාජකීය අවමංගල පෙරහැර**

රාජකීය මෘතදේහය ආදාහන භූමියට ගෙනයෑම සඳහා අලංකාර මෙන්ම ගාම්භීර අවමංගල පෙරහැරක් පැවැත්වූ බවට මූලාශ්‍රය රැසකින් තොරතුරු අනාවරණය වේ. මහනුවර යුගයේ පැවැත් වූ රාජකීය අවමංගල පෙරහැරක් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු වාර්තා කරන්නේ ලන්දේසි ජාතික පූජක ෆිලිප්පුස් බැල්දියස් ය. හෙතෙම පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ වැඩිමහල් පුත් මහාඅස්තාන කුමරුගේ අවමංගල පෙරහැර පිළිබඳ වාර්තා කර තිබේ.



**ඡායාරූපය 01 - මහාඅස්ථාන කුමරුගේ අවමංගල පෙරහැර**
**Baldaeus, 1960, p. 59**

ඊට අනුව අවමංගල පෙරහැර ආදාහන භූමිය බලා ගමන් අරඹන ලද්දේ දිවා කාලයේදී ය. රජමාලිගයේ සිට පැය භාගයක පමණ දුරකින් පිහිටි ආදාහන භූමිය දක්වා මග දෙපස වැසී තිබුණේ මාහැඟි සළුවලින් අලංකෘත තොරණවලිනි. කාලවර්ණ වස්ත්‍රයෙන් සැරසුණු කුමරුගේ සංගීතඥයන් අවමංගල පෙරහැරේ පෙරමුණේ ද, ඔවුන්ට පිටුපසින් පේළි තුනකට වන සේ තුවක්කු භටයන්, වෛද්‍යවරු, සේසත් දරන්නන් සහ පළිස් හා කෙටේරි දැරූ භටයන් ද, යුද ඇතුන් පිට නැගි රදල ප්‍රධානීන් ද, පර්සියානු අසුන් පිට නැඟී සූර්යධජ රැගත් රදලයන් අටදෙනකු සහ නිල ධුරාවලිය අනුව පෙළගැසුණු කඤ්චුකී නිලධාරීන් ගමන් කර තිබේ. අනතුරුව කළුවිල්ලුද මත තැබූ සෙංකෝලය, ඔටුන්න හා රාජභාණ්ඩ ගෙනයනු ලැබීය. කුමරුගේ මෘතදේහය සහිත දෙණ ඔසවාගෙන යනු ලැබුවේ රදලයන් අටදෙනකු විසිනි. ඒ සමගම විශාල අවාන් ගත් දහසයදෙනකු, ශ්වේතඡත්‍ර දැරූ සිවුදෙනකු, සුදුකුඩ ගත් අටදෙනකු හා බුලත් මංජුසා ගත් සයදෙනකු ගමන් කළ අතර විශාල අවාන් ගත් පිරිස ස්ථානගත කොට තිබුණේ කුමරුගේ දෙණ වටා ය. මීළඟට දිසාවේරුන් පිරිවරා ගමන් කරන ලද්දේ සෙනරත් රජතුමා ය. රජතුමාට පිටුපසින් අනෙකුත් සියලුම නිලධාරීන් හා මහජනතාව ගමන් කර තිබේ (Baldaeus, 1960, pp. 57-60).

සෙනරත් රජ සමයෙන් පසුව රාජකීය අවමංගල්‍ය පෙරහැරක් පිළිබඳ තොරතුරු හමුවන්නේ දෙවන රාජසිංහ රජතුමාට අදාළව ය. සමකාලීන ඕලන්ද ලේඛනයක සඳහන් විස්තරයට අනුව වර්ෂ 1687දී අභාවප්‍රාප්ත වූ දෙවන රාජසිංහ රජතුමාගේ අවමංගල්‍ය උත්සවය හඟුරන්කෙත නගරයේදී පවත්වන ලද්දේ එවකට ඕලන්ද ආණ්ඩුකාර ලෝරන්ස් පිල්ගේ සහභාගිත්වයෙනි. අවමඟුල් පෙරහැර ඕලන්ද ආණ්ඩුකරු රැඳී සිටි තාවකාලික මන්දිරයේ සිට පෙළගැසී ඇත්තේ පහත පරිද්දෙනි. එහි පෙරමුණේ රැඳී සිටියේ එකෙකු පිටුපස අනෙකා සිටින සේ පෙළ ගැසුණු ඕලන්ද ලස්කිරිඤ්ඤ භටපිරිසයි. අනතුරුව කළුසේද පටියක් අතේ බැඳ පිටේ බැඳි තුවක්කුව බිමට හරවා ගමන් කළ පාබල සේනා කණ්ඩායමක් හා ලංසයේ කළුපටි බැඳි ලංසකාර හේවායන් පෙරහැරේ ගමන් කර තිබේ. ඉන්පසු අවමංගල ඇඳුමින් සැරසුණු යුදහමුදාවේ සියලු මුලාදෑනීන් ඒ ඒ භට කණ්ඩායම් සමග ගමන් කළ අතර සෑම භට කණ්ඩායමකටම පෙරටුව වහලුන් විසින් කුඩා කාලතුවක්කුව බැගින් ඇදගෙන යනු ලැබීය. පසුව වෙඩි තැබීමේ උපකරණ සහිත තුවක්කු හමුදාවේ සාමාජිකයන් සහ අතේ හා ඉනේ කෙටේරිය සහිත භට කණ්ඩායමක සාමාජිකයන් ගමන් කර තිබේ. ඉන්පසුව අවමඟුල් බෙර වැයූ බෙරකරුවන් මා හොරණෑකරුවන් අසුපිට නැගී ගමන් කළ අතර ඔවුන් සැරසී සිටි අවමඟුල් වස්ත්‍රයේ රජතුමාගේ රාජකීය සටහන වූ රන්වන් පලිහක ඇති රතුපාට සිංහරුව ගෙත්තම් කර තිබිණි. අනතුරුව දෙපස කුඩා ධජ දෙකක් සහිතව රජතුමාගේ මහාධජය ගෙන යනු ලැබීය. ඊට පිටුපසින් කළුවිල්ලුද වස්ත්‍රයෙන් සැරසූ ආරෝහකයන් රහිත අසුන් දෙදෙනෙකු ගමන් කර තිබේ. මීළඟට කොපුවෙන් බැහැර කරන ලද රජතුමාගේ රන්කඩුව, යුධ තොප්පිය සහ සන්නාහය බන්දේසිවල තබා අවමඟුල් වස්ත්‍රයෙන් සැරසුණු වෙළෙඳුන් විසින් රැගෙන ගිය අතර ඊට පසුපසින් අසුන් සයදෙනකු විසින් ඇදගෙන යනු ලැබූ රජතුමාගේ මෘතදේහය තැන්පත් රාජකීය අවමඟුල් රථය ගමන් කර තිබේ. වහලුන් සයදෙනකු විසින් එහි අසුන් අල්ලාගෙන ගමන් කළ අතර මංගල අශ්වයා ද අවමඟුල් වස්ත්‍රයෙන් සරසා උසස් නිලධාරීන් දෙදෙනකු විසින් ගෙන

යන ලදී. අවසාන වශයෙන් දෙපසින් කෙටේරි හා හෙල්ල රැගත් රදලයන් සයදෙනකුගේ ආරක්ෂාව යටතේ රන්කම් කළ කළුවිල්ලුද හා මුතුදැලෙන් අලංකෘත වියනක් යට, රිදී බන්දේසිවල තැබූ කළුවිල්ලුද කොට්ට මත රජතුමාගේ ඔටුන්න සහ ජයකොන්තය රැගෙන යනු ලැබුවේ උසස් රදලයන් දෙදෙනකු විසිනි. රජතුමාගේ අවමඟුල් උත්සවය සඳහා පැමිණි ලන්දේසි ආණ්ඩුකාර ලෝරන්ස් පිල් සම්පූර්ණ අවමඟුල් ඇඳුමින් සැරසී රජතුමාට ගෞරව පිණිස සියලුදෙනාටම පසුව ගමන් කළ බව එකී ඕලන්ද ලේඛනයේ සඳහන් වේ (අභයසිංහ, 1998, පි. 26-27). ඕලන්ද ආණ්ඩුකරුගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු නිසාදෝ දෙවන රාජසිංහ රජතුමාගේ (1635-1687) අවමඟුල් පෙරහැරේ අංගවල විදෙස් නැඹුරුවක් පෙන්නුම් කෙරේ. මෙම අවමඟුල් පෙරහැරෙන් රජතුමාගේ යුද බලය විදහා දැක්වීමක් සිදුකළ බව ද හඳුනාගත හැකිය.

දෙවන රාජසිංහ රජ සමයෙන් පසුව නැවත රාජකීය අවමංගල්‍ය පෙරහැරක් පිළිබඳ තොරතුරු වාර්තා වන්නේ ශ්‍රී විජය රාජසිංහ රජතුමාගේ (1739-1747) අවමංගල්‍ය පෙරහැර පිළිබඳව ය. *මන්දාරම්පුර පුවතේ* සඳහන් වන අන්දමට අවමංගල පෙරහැරේ පළමුවග ගමන් කරන ලද්දේ අවමංගල්‍ය තූර්ය නාද පවත්වමින් කොඩි රැගෙන ගිය මහජනතාවයි. අනතුරුව අවිආයුධ හා දුනු රැගෙන සරඹ දක්වමින් දෙදහසක පමණ හට පිරිසක් ගමන්කොට තිබේ. මීළඟට සන්නාහයෙන් සැරසී ඇතුන් හා අසුන් පිට නැඟී සේනාපතියන් දහසයදෙනකු ගමන්කොට ඇත්තේ කඩු හා දුනු රැගෙන රණ ගී ගයමිනි. රාජකීය අවමංගල්‍ය සඳහා සහභාගි වූ විදෙස් තානාපතිවරුන් ඉන්පසුව ගමන් කළ අතර උඩැක්කි, පන්තේරු, ලී කෙළි සහ කස, සක්, නලා ද චාමර හා පලිහ දැරූ කණ්ඩායම් ඒ සමග විය. රාජකීය අවමංගල්‍ය උත්සවයේ ආගමික කටයුතු සඳහා වැඩමකළ භික්ෂූන් වහන්සේලා පනස්නමක් උඩුවියන් හා චාමර තේවාව සහිතව ගමන් ගත්තේ මීළඟට ය. ඉන්පසුව සුදුසඳුන් හා රත්සඳුන්, දේවදාර ආදී දැව වර්ග ද, කපුරු හා සුවඳ තෙල් පිර වූ රථයක් ගමන් කර තිබේ. අනතුරුව දෙපස සිට අවමඟුල් ගී ගයන කණ්ඩායමට මැදිව දෙණ රැගත් කළු අශ්වයන් යෙදූ අවමංගල රථය ද, ඊට පිටුපසින් අවමංගල වෙස්ගත් දහසය බැගින් වූ කණ්ඩායම් කිහිපයක් විය. මෙම රාජකීය අවමංගල පෙරහැරේ අවසානයට කස පේළියකින් හා හමුදා පිරිවර සහිතව ඇමතිවරුන් පිරිවරා ගමන් කරන ලද්දේ අභිනව රජතුමා වූ කීර්ති ශ්‍රී රාජසිංහ ය (*මන්දාරම්පුර පුවත*, 2013, 617-623 කවි).

මෙයින් අනතුරුව උඩරට රාජධානියේ විචිත්‍ර හා ගාම්භීර අවමඟුල් පෙරහැරක් පැවැත් වූ බවට සාධක හමු නොවේ. එය ක්‍රමයෙන් සරල වී ඇති බව ඩේවිගේ රාජකීය අවමඟුල් පෙරහැර සම්බන්ධ විස්තරයෙන් පැහැදිලි වේ. ඩේවිගේ විස්තරයට අනුව රජතුමාගේ මෘතදේහය තැන්පත් දෙණ ආදාහන මළුවට රැගෙන යන ලද්දේ කුණමක තබාගෙන ය. එහිදී මිනිසුන් සතරදෙනකු විසින් උසුලාගත් මැස්සක් මත සිටින ස්ත්‍රීන් දෙදෙනකු විසින් මිනීපෙට්ටිය මතට සහල් විසි කර තිබේ. රජතුමාගේ දේහය රැගත් කුණමට පිටුපසින් නිලමේවරුන් ගමන් කර ඇත්තේ ස්වකීය පවුල්වල සාමාජිකයන් පිරිවරාගෙන ය (Davy, 1821, p. 161).

මෙම විස්තරවලට අමතරව වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමියන්ගේ අවමංගල පෙරහැර පිළිබඳ විස්තරයෙන් ද එවකට රාජකීය අවමංගල පෙරහැරක් සැකසුණු අන්දම පිළිබඳ අදහසක් ලබාගත හැකිය. *සංඝරාජ සාධු චරියාවේ* සඳහන් වන අන්දමට සඟරජ මාහිමියන්ගේ දේහය ආදාහන බිමට වැඩම කරවීමේදී දේහයට ඉහළින් උඩුවියනක් අල්වාගෙන ගිය අතර ඉරහඳ රූ සහිත සේසත් දෙකක්, ධවල වර්ණ මුතුකුඩ හා සේසත්, වඩනා තල්පත්, සුවඳ දුම්කබල්, අත්පන්දම් සහ ධජ රැගත් පිරිස් ගමන් කොට තිබේ. ඉන්පසුව අත්තුවක්කු හා කොඩිතුවක්කු මෙන්ම පංචතූර්ය භාණ්ඩ හඬනංවමින් ඒවා රැගත් පිරිස් ද, සේනාපතිවරුන් යටතේ සන්නද්ධ හමුදා කණ්ඩායම් ද, රජතුමා පිරිවරා ගත් නිලධාරීන් සහ මහජනතාව ගමන් කළ බව සඳහන් වේ (*සංඝරාජ සාධු චරියාව*, 1997, පි. 53). මෙම තොරතුරුවලට අනුව රාජකීය අවමංගල පෙරහැරේ ද මෘතදේහයට ඉහළින් උඩුවියනක්, ඉරහඳ රූ සහිත සේසත්, ධවල වර්ණ මුතුකුඩ හා සේසත් මෙන්ම වඩනා තල්පත් සහ සුවඳ දුම්කබල් ආදිය රැගෙන ගිය බව පිළිගැනීමට පුළුවන.

**ආදාහනය සඳහා චිතකය සැකසීම**

රාජකීය මෘතදේහය ආදාහනය කිරීම සඳහා චිතකය හෙවත් දරසෑය සැකසීමේදී ඒ පිළිබඳ විශේෂ අවධානයක් දක්වා තිබූ බව හඳුනාගත හැකිය. බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීම සඳහා සෑම ආකාරයකම සුවඳ දර යොදා චිතකයක් සෑදූ බව මහාපරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ. සක්විති රජකුගේ අභාවයකදී චිතකය ඉදිකරවන්නේ ද එපරිද්දෙනි (*දීඝ නිකාය* ද්විතීය භාගය, 2004, පි. 222-223). ලංකාවේ ද සුවඳ දරවලින් කරවන ලද චිතක රජවරුන්ගේ ආදාහන කටයුතු සඳහා යොදාගෙන තිබේ. මහනුවර යුගයේදී එලෙස චිතකය සෑදූ බව පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ පුත් මහාඅස්තාන කුමරුගේ ආදාහනය පිළිබඳ වාර්තාවෙන් හඳුනාගත හැකිය.



**ඡායාරූපය 02 - දේහයක් දැවීම සඳහා චිතකයක් තනා තිබූ අන්දම**
**Knox, 1681, p. 117**

එහිදී ආදාහන මණ්ඩපය පඩිපේළි සතකින් උස්කොට තනා තිබුණේ මධ්‍යයේ පුළුල් විවරයක් පිහිටන පරිදි ය. ඒ තුළට සඳුන් හා වෙනත් සුවඳ දැව විශාල ප්‍රමාණයක් දමා තිබූ බව බැල්දියස් සඳහන් කරයි (Baldaeus, 1960, p. 60). ශ්‍රී විජය රාජසිංහ රජතුමාගේ චිතකය සොළොස් රියන් උසට තනා තිබුණේ සඳුන් දර යොදාගනිමිනි (*මන්දාරම්පුර පුවත*, 2013, 624 කවිය). සරණංකර සඟරජ මාහිමියන්ගේ චිතකය නවමහල් වන සේ තනා තිබූ බව සඳහන් වේ (*සංඝරාජ සාධු චරියාව*, 1997, පි. 53). ඒ නිසා රාජකීයයන්ගේ හා නායක භික්ෂූන්ගේ තත්ත්වයට ගැලපෙන අන්දමින් චිතකයේ උස හා මහල් ගණන තීරණය වූ බව පෙනේ.

චිතකය තැනීමට යොදාගන්නා ද්‍රව්‍ය අතර සඳුන් සහ සුවඳැති දැවවලට අමතරව තෙල්, කීල් (බිම් දුම්මල) සහ නා නා සුවඳ ද්‍රව්‍ය වූ බව ඩේවි සඳහන් කරයි (Davy, 1821, p. 161). පෙරදිග තිබූ ඉතා වටිනා කුළුබඩු වර්ග මෙම චිතකයට එක්කර තිබූ බව ක්වේරෝස් දක්වන්නේ පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ ආදාහනය පිළිබඳ ඔහුගේ වාර්තාවේ ය (පීරිස්, 2008, පි. 601). දරසෑයට පිටතින් ඉහළට වන්නට වියනක් බැඳීම සහ සෑය අවට පොල්වලු එල්ලීම ද, අවට මල් ලියකමින් සහ ධජ ආදියෙන් සැරසීම ද සිදු වූ බව නොක්ස් සඳහන් කරයි (Knox, 1681, p. 116).

**ආදාහනයට පෙර පැවැත්වුණු ආගමික චාරිත්‍ර**

ආදාහනයට පෙර ආගමික චාරිත්‍ර ඉටුකොට මියගිය තැනැත්තාගේ පරලොව දිවියට අවශ්‍ය ආශීර්වාදය ලබාදීම අතීතයේ පටන් සිදු කෙරෙන චාරිත්‍රයකි. මහනුවර යුගයේ රාජකීය අවමංගල උත්සවයේ ආගමික චාරිත්‍ර පිළිබඳ විමසා බැලීමේදී වර්තමානයේ තරම් චාරිත්‍ර විධි රාශියක් එකල සිදුවූවා ද යන්න සැක සහිත ය.

රාජකීය අවමංගල උත්සවයේ ආගමික චාරිත්‍ර සඳහා රාජධානියේ නොයෙක් විහාරවලින් භික්ෂූන් වැඩම කරවනු ලැබ තිබේ. දෙණ චිතකයට ඇතුළු කිරීමෙන් අනතුරුව පැවැත් වූ ආගමික කටයුතුවලදී භික්ෂූන් පැමිණ සිටි පිරිස පංචසීලයේ පිහිටුවා පසුව ත්‍රිලක්ෂණ දේශනාවක් සිදු කර තිබේ. අභාවයට පත් රජතුමාගේ පරලොව යහපත උදෙසා ආගමික චාරිත්‍ර ඉටුකිරීමෙන් පසුව උන්වහන්සේලාට මතකවස්ත්‍ර පූජා කර ඇත්තේ තවත් ප්‍රත්‍ය සමගිනි (*මන්දාරම්පුර පුවත*, 2013, 625 කවිය; Davy, 1821, p. 161; Baldaeus, 1960, p. 60). රාජකීය අවමංගල උත්සවයේ ආගමික

කටයුතුවලදී වර්තමානයේ සිදු කෙරෙන පරිද්දෙන් 'යථාවාරී වහාපූරා....' ආදී ගාථා සජ්ඣායනය කරන්නට ඇති බවත්, අවසානයේදී මතකවස්ත්‍ර පූජා කිරීමෙන් ආගමික කටයුතු නිමාවට පත් වූ බවත් පිළිගත හැකිය.

**රාජකීය මෘතදේහය ආදාහනය කිරීම**



**ඡායාරූපය 03 : මහා**
**අස්තාන කුමරුගේ මෘතදේහය ආදාහනය කිරීම**
**Baldaeus, 1960, p. 61**

ආගමික චාරිත්‍ර ඉටුකිරීමෙන් අනතුරුව එළඹියේ රාජකීය මෘතදේහය චිතකයේ තැන්පත්කොට ආදාහන කිරීමයි. මහාඅස්තාන කුමරුගේ ආදාහනය පිළිබඳ බැල්දියස්ගේ වාර්තාවට අනුව දරසෑයේ වූ විවරයේ දෙණ තැන්පත් කිරීමෙන් අනතුරුව ඒ දෙපස සඳුන් ආදී වටිනා දර මිනිසෙකුගේ උසට තැන්පත් කර තිබේ. පසුව මෘතදේහය තැන්පත් කොට තිබෙන විවරයට විශාල කුරුඳුතෙල් කළ තුනක් හා ගිතෙල් කළයක් වත්කොට අඩ පැයක පමණ කාලයක් ගත කොට ඇත්තේ ඒ සියල්ල දරවලට සහ බිමට උරාගන්නා තෙක් ය. පසුව මියගිය කුමරුගේ හෙදියන් විසින් පිදුරු හුළු අත්තක්, ගිනි අඟුරු සහිත ස්වර්ණමය පාත්‍රයක් හා තවත් හුළු අතු දෙකක් මීගමුවේ දිසාවේ නම් නිලධාරියාට ලබාදුන් අතර ඔහු විසින් මාලිගාවේ ආවතේවකරුවන් දෙදෙනකු හා හෙදියන් සමග'වින් චිතකයට ගිනි තබා තිබේ. ඒ සමග නැවත වරක් විලාප තබමින් හැඬීම ආරම්භ වූ බව බැල්දියස් සඳහන් කරයි (Baldaeus, 1960, p. 60).

මීට මඳක් වෙනස් තොරතුරු කිහිපයක් ඩේවි සඳහන් කරයි. ඊට අනුව මිනීපෙට්ටිය දරසෑයේ තැන්පත් කොට පොරවකින් ගසා මිනීපෙට්ටියේ පියන විවෘත කිරීම සිදු කර තිබේ. එසේම මියගිය රජතුමාගේ ඥාතියකු විසින් චිතකයට ගිනි තබන ලදැයි ඩේවි සඳහන් කරයි (Davy, 1821, p. 161). සෑයට සිවුදෙසින් ගිනි තැබූ බව ද කියැවේ (*මන්දාරම්පුර පුවත*, 2013, 625 කවිය). ඉහත සඳහන් මියගිය පුද්ගලයාගේ ඥාතියකු විසින් චිතකයට ගිනි තැබීමේ සිරිත වර්තමානයේදී ද දැකගත හැකි සිරිතකි. එහිදී මියගිය පුද්ගලයාගේ බෑණාවරු අතින් එම කටයුත්ත සිදු වේ.


චිතකයට ගිනි තබා එය ගිනිදළුවලින් වැසී යන තෙක් ආදාහන භූමියේ රැඳී සිටි නිලමේවරුන් අඩි සතක් පමණ උසැති කුළුණුවල රැඳ වූ රන් රිදී වැඩ දැමූ වියනක් යට සිටි බව බැල්දියස් සඳහන් කරයි (Baldaeus, 1960, p. 60). චිතකය ගිනිදළුවලින් වැසීයාමත් සමග අවමංගල රථය හා එහි අශ්වයන් ගඟෙන් එතෙරට පිටත් කොට, දියට බැස නා පිරිසිදු වී රාජකීය අවමංගල්‍යයට සහභාගි වූ පිරිස නැවතත් නගරයට පැමිණ තිබේ (*මන්දාරම්පුර පුවත*, 2013, 626 කවිය). ඩේවි සඳහන් කරන්නේ රජමාලිගයට ගොස් රාජකීය අවමංගල්‍යයේ කටයුතු නිමාවට පත් වූ බව අභිනව රජතුමාට දන්වන නිලමේවරුන් රජතුමාගේ උපදෙස් පරිදි නිවෙස්වලට පිටත්ව හිස් සෝදා නා පිරිසිදු වූ බවයි (Davy, 1821, p. 161-162).

දරසැයේ ගින්න නොනිවා එකොළොස් දිනක් තබාගන්නා අතර ඒ කාලය පුරා අවමඟුල් බෙර වැයීම සිදුව තිබේ. එම කාලසීමාවේදී බුලත්, පුවක් මෙන්ම රජතුමා අනුභව කිරීමට ප්‍රිය කළ ආහාර දරසැයට දැමීම සිදු වූ බව කියැවේ (Davy, 1821, p. 161-162). එකොළොස් දිනක් චිතකය නොනිවා තබාගැනීමේ අරමුණ පැහැදිලි නැතත්, හොඳින් මෘතදේහය දැවීම එහි අරමුණක් වන්නට ඇත. දැවෙන චිතකයට ආහාර දැමීම මගින් ප්‍රාග්ඓතිහාසික යුගයේ පටන් පැවත එන මළවුන් උදෙසා ආහාර පිදීමේ චාරිත්‍රයේ ලක්ෂණ හඳුනාගැනීමට පුළුවන.

**භෂ්මාවශේෂ තැන්පත් කිරීම**

එකළොස් දිනක් චිතකයේ ගින්න නොනිවා තබාගැනීමෙන් පසුව කිරි හා පොල්වතුර භාවිතයෙන් එය නිමා දමා, පිළිස්සුණු ඇටකැබලි තෝරාගෙන ඒවා මැටි බඳුනකට දමා මුද්‍රා තැබීමත්, ඉතිරි ඇට කැබලි සහ අළු සොහොනක තැන්පත් කිරීමත් මීළඟට සිදුව තිබේ (Davy, 1821, p. 162). මැටි බඳුන් තුනක් රැගෙන විත් ඒවාට පිළිවෙලින් අස්ථි කොටස්, අළු හා දැවී තිබෙන ආභරණාදිය එකතු කරන ලද්දේ එකී කාර්යය සඳහා නිල වශයෙන් පත්කර තිබූ අළුපොල හෙවත් අරුප්පොල ගම්වාසීන් ය. ඔවුන්ගේ ගමට 'අළුපොල' යන නම හිමිව ඇත්තේ ද ඒ නිසා බව කියැවේ. අවශේෂ කොටස් එකතු කිරීමෙන් පසුව මැටි බඳුන් තුනෙන් අළු සහිත බඳුන හැර අනෙක්වා සොහොනක තැන්පත් කොට තිබේ (Lawrie, 1896, p. 2).

රජතුමාගේ මෘතදේහය දැවීමෙන් අනතුරුව ඉතිරිවන අළු හැර අනෙක් අස්ථි කොටස් හා දැවුණු ආභරණාදිය සොහොනක තැන්පත් කිරීම අතීතයේ පටන් පැවත ආ සිරිතකි. ඒ සඳහා මහා පරිනිබ්බාණ සූත්‍රයේ එන ස්තූප ඉදිකොට ගෞරව කළ යුතු පුද්ගලයන් පිළිබඳ සංකල්පය පාදක වූ බව පෙනේ. ලක්දිව රජතුමා බෝධිසත්වයකු ලෙස සලකා රජවරුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කුඩා ප්‍රමාණයේ ස්තූප ඉදිකර තිබේ.



**ඡායාරූපය 04 ඃ අස්ගිරි ආදාහන මළුව හි රාජකීය සොහොන් කොත්**
**Forbes, 1994, p. 300**

උඩරට රජවරුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් ස්තූප හැඩැති සොහොන් ඉදිකරන ලද්දේ අස්ගිරි ආදාහන මළුවේ පසෙකට වන්නට ය. දකුණු ඉන්දියාවේ වෙල්ලෝරයේදී අභාවයට පත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ හැරුණු විට අනෙක් සෑම රජකුගේම භෂ්මාවශේෂ තැන්පත් සොහොන් එහි ඉදි කර තිබිණි (දිසානායක, 1997, පි. 69).

**භෂ්මාවශේෂ ගඟේ පාකර හැරීම**

රජතුමාගේ දේහය දැවීමෙන් ඉතිරි වූ අළු ජලයේ පා කර යැවීම සඳහා භාරතයේ ඇති ගංගා නම් නදියේ භෂ්මාවශේෂ පා කර යැවීමේ හින්දු චාරිත්‍රයේ ආභාසය ලැබෙන්නට ඇත. මෙහිදී භෂ්මාවශේෂ සහිත මැටිබඳුන හිස මත තබාගෙන මහවැලි ගඟ වෙත රැගෙන යන ලද්දේ කාලවර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී වෙස්මුහුණක් පැළඳ සුරතින් අසිපතක් ගත් පුද්ගලයකු විසිනි. ඔහු ගමන් කර ඇත්තේ ඇතකු හෝ අසකු පිට ය. කටුගස්තොට තොටුපළට පැමිණෙන භෂ්මාවශේෂ බඳුන හිස දැරූ පුද්ගලයා කුඩා ඔරු දෙකක් එක්කොට, ඒ මත කොළ අතුවලින් වසා තැනූ කුටියට ගොඩ වී ඇත්තේ පිහිනා ගොසිනි. පසුව මිනිසුන් දෙදෙනකු එකී ඔරුව ගඟ මැද ගැඹුරුතම ස්ථානයට

තල්ලුකොට ආපසු පැමිණීමත් සමග හෂ්මාශේෂ බඳුන රැගෙන ගිය පුද්ගලයා බඳුන අසිපතෙන් දෙපළු කොට ගඟේ පා කොට කිමිදී ගඟේ අනෙක් ඉවුරට පැමිණ පලා ගොස් තිබේ. ඔහු ගමන් ගත් ඔරුව නිදැල්ලේ පාවීයාමට සැලැස් වූ අතර ඔහු තොටුපොළට පැමිණි ඇතා හෝ අශ්වයා ගඟෙන් එගොඩට පිටත්කොට ඇත්තේ නිදැල්ලේ සැරිසැරීමට ය. එපමණක් නොව රජතුමාගේ මිනීපෙට්ටියට සහල් ඉසීම කළ කාන්තාවන් හා ඔවුන් රැගත් මැස්ස උසුලා ගෙන ගිය පුරුෂයන් සිවුදෙනා ද ගඟෙන් එගොඩට පිටත් කර ඇත්තේ නැවත මෙගොඩට නොපැමිණෙන ලෙස නියෝග කරමිනි (Davy, 1821, p. 162-163). ඔවුන් මියයන තෙක් ගඟෙන් එගොඩ ජීවත්විය යුතු හෙයින් ඔවුන්ගේ යැපීම සඳහා අවශ්‍ය දෑ රජවාසල මගින් සැපයූ කියැවේ.

මරණයත් සමග බැඳී පවතින අශුද්ධ බව පිළිබඳ සංකල්පය හේතුවෙන් අවමංගල්‍ය චාරිත්‍ර සඳහා සම්බන්ධ වූ පුද්ගලයන්, සතුන් මෙන්ම භාණ්ඩ නැවත භාවිත කිරීම අසුබ දෙයක් වශයෙන් සැලකීම මීට හේතුවන්නට ඇත. රාජකීය අවමංගල්‍ය උත්සවයේ කිසියම් හෝ කාර්යයකට සහභාගිවූවන් පවා අභිනව රජතුමාගේ සේවය සඳහා බඳවා නොගැනීමේ සිරිතක් පැවති බව කියැවේ. එය කෙතරම් තදින් ක්‍රියාත්මක කළේ ද යත් රාජකීය අවමංගල්‍ය පෙරහැරේ සේසතක් උසුලාගෙන ගිය අයකු පවා අභිනව රජතුමාගේ සේවය සඳහා බඳවා නොගත් බව කියැවේ (කහඳගමගේ, 1999, පි. 34).

එහෙත් මේ සම්බන්ධයෙන් ලෝරිගේ වාර්තාව තරමක් වෙනස් ස්වරූපයක් ගනී. ලෝරිට අනුව රජතුමාගේ හෂ්මාවශේෂ මහවැලි ගඟේ පාකර හැරීමේ කාර්යය පැවරී තිබුණේ ද අළුපොල ගම්වැසියන්ට ය. සුදු වස්ත්‍රයෙන් සැරසී සුරතින් අසිපතක් රැගෙන හිස මතින් අළු සහිත මැටි බඳුන රැගෙන ගිය අළුපොල ගම්වැසියා, ගහලගම්බොඩ නම් ග්‍රාමයේ පුරුෂයන් සිවුදෙනෙකු විසින් මැස්සකින් මහවැලි ගඟේ තොටුපොළක් වෙත රැගෙන යනු ලැබේ. මැස්ස බිම තැබීමෙන් පසු අළු බඳුන සමග ගඟ මැදට පිහිනා යන අළුපොල වැසියා අසිපතෙන් මැටි බඳුන බිඳ දමා ගඟේ අනෙක් ඉවුරට ගොඩ වේ. ඔහුට නැවතත් මෙගොඩට පැමිණීමේ අවසරය හිමිව ඇත්තේ තෙමසක් ගතවීමෙන් අනතුරුව ය (Lawrie, 1896, p. 2).

ඥචාරිත්‍ර සියල්ල නිමාවට පත්වීමත් සමග නැවත වරක් ප්‍රධාන චතුරශ්‍රයේදී නිලමේවරුන් විසින් රාජකීය අවමංගල්‍යයේ කටයුතු නිමා වූ බව අභිනව රජතුමාට දැනුම්දෙනු ලැබේ. පසුව අභිනව රජතුමාගේ නියමයෙන් ඔවුන් නැවත වරක් නිවෙස්වලට පිටත්ව හිස් සෝදා නා පිරිසිදු වේ. මියගිය රජතුමා, අභිනව රජතුමාගේ සමීපතම ඥාතියකු වන්නේ නම් පමණක් අභිනව රජතුමා හා රාජසභාව කලක් ගතවතුරුම කළු වස්ත්‍රයෙන් සැරසී සිටි බවත්, එසේ නොමැති නම් අභිනව රජතුමා කළු ලේන්සුවක් පමණක් හිසේ පැළැඳ සිටි බවත් ඩේවි සඳහන් කරයි (Davy, 1821, p. 163). මෙයින් රාජකීය අවමංගල්‍ය උත්සවයේ නිමාව සනිටුහන් වූ බව පෙනේ.

මහනුවර යුගයේ අවමංගල්‍ය චාරිත්‍ර ගණනාවකදී කළුවස්ත්‍ර යොදාගත් බව සඳහන්ව තිබීම මෙහිදී අවධානයට යොමු කළ යුතු කරුණකි. වර්තමාන සමාජයේ අවමංගල්‍ය කටයුතුවලදී බෞද්ධ ප්‍රජාව සුදුවස්ත්‍ර භාවිත කිරීමත්, කතෝලික හා ක්‍රිස්තියානි ප්‍රජාව කළුවස්ත්‍ර භාවිත කිරීමත් සම්මතයකි. මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය චාරිත්‍ර සඳහා කළුවස්ත්‍ර යොදාගැනීම එකී තොරතුරු යුරෝපීයන් වාර්තා කිරීම නිසා ඇති වූ දෝෂයක් ද, නැත් ද යන්න අවිනිශ්චිත ය.

**සමාලෝචනය**

මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය උත්සව හුදෙක් අවමංගල්‍ය උත්සවයක් පමණක් නොව, අභාවයට පත් රජතුමා හෝ රාජකීයයා වෙනුවෙන් ජනතාවගේ ගෞරවය ප්‍රකාශ කිරීම, රජතුමා සහ නිලධාරීන් අතර පැවති සබඳතාව පෙන්නුම් කිරීම සහ මියගිය රජතුමාගේ යුධ ශක්තිය ප්‍රදර්ශනය කිරීමට යොදාගත් එකක් යැයි හඳුනාගත හැකිය. මෙකල රාජකීය අවමංගල චාරිත්‍ර විධි ආරම්භයේ සිට අවසානය දක්වා එකිනෙකට බද්ධව පැවතීම විශේෂත්වයකි. මෙම අවමංගල්‍ය චාරිත්‍ර විධි සඳහා හින්දු ආභාසය ද, යුරෝපීය ආභාසය ද ලැබී තිබෙන බව පිළිගැනීමට පුළුවන. මෙහි ඇති වැදගත් කරුණක් නම් මරණය සමග බැඳී පවතින අශුද්ධ හා අසුබ විශ්වාස රාජකීය අවමංගල්‍යයක් සඳහා වුව ද එයාකාරයෙන්ම බලපැවැත්වීමයි. මහනුවර යුගයේ රාජකීය අවමංගල්‍ය උත්සව ආරම්භයේදී අතිශය විචිත්‍ර සහ ගාම්භීර අන්දමින් සිදුවුව ද, ක්‍රමයෙන් එය සරල මට්ටමකට පත්ව ඇති බව හඳුනාගත හැකිය. රාජධානිය තුළ ක්‍රමයෙන් ඇතිවෙමින් පැවති අස්ථාවර භාවය ඒ සඳහා හේතු වන්නට ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අභයසිංහ, පී.ඇම්.පී. (1998). උඩරට විත්ති, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
කහඳගමගේ, සන්ධ්‍යා (1999). ජීව දානයෙන් මතක දානයට. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
දිසානායක, සෙනරත් බණ්ඩාර (1997). දියතිලක නුවර. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
දීඝ නිකාය ද්විතීය භාගය - මහා පරිනිබ්බාණ සූත්‍රය (2004). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
නිශ්ශංක, එච්.එස්.එස්. (2005). වෙනස් වූ උඩරට සහ නුවර යක්කු. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
පීරිස්, පෝල් ඊ. (2008). ලංකාව පෘතුගීසී යුගය - කාණ්ඩ 1. හේවාවවසම්, අභය (පරි.). සූරිය ප්‍රකාශකයෝ.
මන්දාරම්පුර පුවත (2013). චන්දානන්ද හිමි, මන්දාරම්පුර (සංස්.). කර්තෘ ප්‍රකාශන.
රාජාවලිය (1997). සුරවීර, ඒ.වී. (සංස්.). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ (1997). අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
සංඝරාජ සාධු චරියාව (1997). විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.). සමයවර්ධන ප්‍රකාශකයෝ.
හත්ථවනගල්ල විහාරවංස (2001). අමරතුංග, ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර (සංස්.). සමයවර්ධන පොත්හල සමාගම.
හේමපාල, නුවරඑළියේ (1999). සිංහළේ අන්තිම රජතුමා. සාර ප්‍රකාශන.
Baldaeus, Phillipus (1960). *A True & Exact Description of the Great Island of Ceylon*. Tisara Publishers.
Davy, John (1821). *An Account of the Interrior of Ceylon*. Longman Hurst Rees Orme & Brown.
Knox, Robert (1681). *An Historical Relation of Island Ceylon in the East Indies*. Royal Society.
Lawrie, A.C. (1896). *A Gazetteer of the Central Province of Ceylon* - Vol. I. Government Printer.
Major Forbes (1994). *Eleven Years in Ceylon* - Vol. I. Asian Educational Service.